# ළමා ප්‍රදීපය

ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 ඔක්තෝබර් 14 සඳුදා
05 වෙළුම - 49 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

මිල රු 10/-



ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# "දේව වචනය" පුංචි ඔබව සැමද ජීවත් කරනවා.

**ආදරණීය දූවේ පුතේ...**

කොළඹ - අගරදගුරු පදවිය මුල්කොට ගෙන දේව වචනයේ වසර ප්‍රකාශයට පත් කළේ මීට වසර දෙකකට පෙරයි. ඔබට මතකයි නේද? එද තේවත්ත පුදබිමේදී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඇතුළු සියලු පැවිදි , පූජක තුමන්ලා පෙරටු කොට ගෙන ගිහි ජනතාව ඉදිරියේ විශේෂාකාරයෙන් ඒ වසර ප්‍රකාශයට පත් කළ අයුරු. ඉතිං ඒ දේව වචනයේ වසර ඉතා ප්‍රබලව අප මීසම් අතර කථා බහටත්, ඒ වගේම ඒ වසර මුල් කොට ගෙන විවිධ ආධ්‍යාත්මික ක්‍රියාකාරකම් ඉටු කිරීමටත් ඒ මීසම් වල බොහෝ දෙනෙක් කැප වුනා. තවමත් නොනිමි භක්ති ක්‍රියාකාරකම් රැසක් දේව වචනයේ වසර මුල් කොට ගෙන ක්‍රියාත්මක වෙමින් පවතිනවා. දැන් එය දස වසරක් පුරා දිව යන ව්‍යායාමයක් වෙලා.

ආදර දූවේ පුතේ, කතෝලික විශ්වාසය සම්පූර්ණයෙන්ම රැඳී පවතින්නේ දේව වචනය තුළයි. ශු. බයිබලයේ ග්‍රන්ථ ක්‍රමිකව පෙළ ගස්වා එහි පැරණි ගිවිසුම, අලුත් ගිවිසුම යනුවෙන් බාණ්ඩ වෙන් කොට ඒ සියලු ක්‍රියාකාරකම් මුල් යුගයේ පටන්ම ඉටු කළේ කතෝලික සභාවයි. විශේෂයෙන්ම, දිව්‍ය පූජාව තුළ මෙම ශුද්ධවූ ලියැවිල්ල මුල්කොට ඒ ගිවිසුම් දෙක අතර මනා සම්බන්ධයක් ඇති කරවන අයුරු අපිට දිනපතාම දිව්‍ය පූජාවට සහභාගි වීමෙන් අවබෝධ කර ගන්නට පිළිවන්. අපේ ජන වන්දනාව තුළ රැඳී පවතින සැම භක්ති අභ්‍යාසයකම මූලික අරටුව දේව වචනය හා සමග සම්බන්ධ වෙනවා. අද ශු. සභාව තුළ වැඩිපුරම කථාවට ලක්වන කුඩා කිතුනු සංඝ පවා ආරම්භ කරන්නටත් එහි ක්‍රියාත්මක බව පසක් කරන්නටත් මුල් වී තිබෙන්නේ දේව වචනයමයි.

ආදර දූවේ පුතේ, කතෝලික විශ්වාසය තුළ අපි හැම කෙනෙක්ම යන්නේ නිමා නොවන ගමනක් බව අමතක කරන්න එපා. මේ නිමා නොවන ගමන් මග නිසා කිතුනු ජීවිතය බොහෝ විට නම් වන්නේ කුඩාරම් ජීවිතයක් හැටියටයි. විවිධ පරිසරයන් තුළ, විවිධ ජන සංයුතින් අතර ජීවත් වීමේදී එකිනෙකාට ඇති වන්නේ, මුහුණ පාන්නට සිදුවන්නේ නිමක් නොමැති ප්‍රශ්න, කම් කටොලු රාශියකටයි. දෛනිකව අප හැම කෙනෙක් හටම ජීවිතයේ විවිධ ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිදුවනවා වගේම, ඇතුලාන්ත ජීවිත ගැටලු හා ප්‍රශ්න වලටත් අපි නිරන්තරයෙන්ම මුහුණ දෙනවා. බොහෝ වෙලාවට ජීවිතයේ ඇතිවන මේ ප්‍රශ්න මුල් කොට ඒ ප්‍රශ්න හා එක්ව ජීවත් වන අය තුළ නිරායාසයෙන්ම ඇති වන්නේ හිස් භාවයක්. නැතිනම් මහා විශාල කණස්සල්ලක්. මෙහිදි බොහෝ දෙනෙක් උත්සහ කරන්නේ තමන්ගේම ජීවිතයෙන් පළිගන්නටයි. නමුත් දේව වචනය තුළ ස්ථිරසාරව ජීවත් වන්නාට නියම පිළිතුරු හා සහනය දේව වචනය තුළම ගැබ්වී පවතිනවා. දේව විශ්වාසයෙන් එලෙස දේව වචනය තුළ ජීවත්වන්නා හට පුදුමාකාර සහනයක් හා නිත්‍ය පිළිතුරක් දේව වචනය තුළම සම්භවන නිසා කිසිදක එම තැනැත්තා හෝ තැනැත්තිය ජීවිතය හිස් භාවයකින් පුරවා ගන්නේ නැහැ. කළකිරුණු ස්වභාවයට ගෙන එන්නේ නැහැ.

ඉතිං ආදර දූවේ පුතේ අපි කුඩා කාලයේ පටන්ම දේව වචනය තුළ ඉතා ගාම්බීර අයුරින් හා ගැඹුරින්ම ජීවත් විය යුතු වෙනවා. අභාග්‍යයකට, අද තැන තැන කුඩා කණ්ඩායම් බයිබල් කණ්ඩායම් කියලා ගෙයින් ගෙට ගොස් මෙම දේව වචනය විකෘති කරනවා. නමුත් කතෝලික සභාව තුළ වැඩෙන දරුවෙක් කිසිමදක දේව වචනය හා සමඟ සෙල්ලම් කරන්නේ නැහැ. ඒ උත්තරීතර දහම් පණිවිඩය හැල්ලු කරන්නේ නැහැ. මූලධර්මවාදින්ට පැවැත්මක් හා සම්ප්‍රදයක් නැති නිසා ඔවුන් කරන්නේ දේව වචනයේ ඇති අන්තර්ගත පණිවිඩය වචනාර්ථයට පමණක් සීමා කොට කථා කිරීමයි. එවිට ඔවුන්ගේ පහසුවට වචනාර්ථයෙන්ම ජනතාව බය කිරීමට ඔවුන් උත්සහ කරනවා.

කතෝලික අපි හැම කෙනෙක්ම දැන් අවබෝධ යක් ඇතිව ජීවත් වන නිසා වචනාර්ථය නොව ඊට ඔබ්බෙන් ඇති තත්ත්වාකාරයන්, කාල වකවානු, ඊට අයත් ජන සංයුතීන් ගැන හැදෑරීමටත් දේව වචනය තුළින් යොමු වෙන නිසා දේව වචනයේ සැබෑ පෝෂණ ගුණය දෙවාලන්නට මහගු ශක්තියක් ලබා ගෙන තිබෙනවා. දේව වචනයේ සහන් එළිය අපේ ජීවිත වලට බලවත්ව දැනෙන්නේ ඒ නිසාමයි. අපිට බයිබලය පරිශීලනය කරන්නට කුඩා කලයේ පටන්ම සුදානමක් තිබෙන්නට ඕනා. දැන් බයිබලය පරිශීලනය කරන්නට උදව් වන අත් පොත් ගණනාවක්ම කුඩා ප්‍රමාණයෙන් සිංහල භාෂාවෙන් පිටවී තිබෙනවා. බයිබලය පිළිබඳ විශාරද දැනුමක් ඇති අය එම පොත්පත් ලියා තිබෙන නිසා ඉතා සරලව හොඳ අවබෝධයක් ලබා ගැනිමට එම පොත් පත් ආශ්‍රයෙන් ඔබටත් මඟක් ඇති කරගන්නට පුළුවන්.

ඉතිං ආදර දූවේ පුතේ, මේ දේව වචනයේ බලය තුළ අපි, මීටත් වඩා දිගු අඛණ්ඩ ගමනක් යන්නට හොඳ අඩිතාලමක් දමා ගත යුතුයි. ඒ ශක්තිය තුළ නිරන්තරයෙන්ම සිහිපත් කරවන විවිධ අභ්‍යාස කටයුතු ඒ පරිශීලනයට හා අත් දැකීමට හොඳ පිටිවහලක්, කතෝලිකයා තුළ දේව වචනයට ඇති ගැඹුරු ආදරය හා ප්‍රේමය තව තවත් වර්ධනය කරන්නට ජේසු සමිඳුන්ගේ පිහිට පතා අප දිනපතා යාච්ඤා කරමු. ඒ ශක්තිය පුංචි ඔබට ස්වාමින් වහන්සේගේ ආශිර්වාදයෙන්ම ලැබේවා.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක
**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**




## මා මැවූ දෙවියන් වහන්සේ

❖ ප්‍ර: සියලූ දේට මූලිකයා කවුද?
උ: දෙවියන් වහන්සේ ය.

❖ ප්‍ර: උන්වහන්සේ සියලූ දේටම මූලිකයා වන්නේ කෙසේද?
උ: අහස හා පොළොව ද එහි අඩංගු වන සියල්ල ද මැවූ නිසා ය.

❖ ප්‍ර: දෙවියන් වහන්සේ ඔබේ කවු ද?
උ: උන්වහන්සේ ස්වර්ගයෙහි වැඩ සිටින මාගේ පියාණෝය.

❖ ප්‍ර: ඒ කෙසේ ද?
උ: මට ඇති ආදරය නිසා තම ජීවිතය මට දී මා දරුකමට පිළිගත් නිසාය.

❖ ප්‍ර: එසේ නම් ඔබ කවුද?
උ: මා දෙවියන් වහන්සේගේ දරුවෙක්මි.

❖ ප්‍ර: දෙවියන් වහන්සේ ඔබ දේව දරුකමට පිළිගත්තේ මක්නිසා ද?
උ: මෙලොවෙහි දී දෙවි පියාණන් දැන හැඳින, ආදරයෙන් උන්වහන්සේට කීකරුව සිට,පරලොවෙහි දී උන්වහන්සේ ඇසින් දකිමින් ප්‍රීති වන පිණිස ය.

## ත්‍රිත්ව ඒක දෙවියන් වහන්සේ

❖ ප්‍ර: දෙවි වරුන් කීප දෙනෙක් වැඩ සිටිත් ද?
උ: නැත, එකම දෙවි කෙනෙක් පමණක් වැඩ සිටිති.

❖ ප්‍ර: එකම දෙවියන් නමුත් වහන්සේලා කී දෙනෙක් වැඩ සිටිත් ද?
උ: වහන්සේලා තුන් දෙනෙක් වැඩ සිටිති.

❖ ප්‍ර: ඒ තුන් දෙනා වහන්සේලා කෙසේ නම් කරමුද?
උ: පියාණන් වන දෙවියන් වහන්සේය, පුත්‍රයාණන් වන දෙවියන් වහන්සේය, ශුද්ධාත්මයාණන් වන දෙවියන් වහන්සේ යයි නම් කරමු.

❖ ප්‍ර: මෙලෙස දේව ස්වභාවයෙහි ඒක දෙවියන් නමුත් වහන්සේලා තුන් දෙනෙකුව වැඩ සිටින දෙවියන් වහන්සේට අප දෙන නාමය කුමක් ද?
උ: ශුද්ධවූ ත්‍රිත්වය යන නාමය ය.

❖ ප්‍ර: ඔබ ශුද්ධවූ ත්‍රිත්වය විශ්වාස කරන බව පෙන්වන්නේ කොහොම ද?
උ: මාගේ යාච්ඤා සහ ප්‍රධාන ක්‍රියා පටන් ගන්නා විටද, අවසාන කරන විටද, කුරුසියේ ලකුණ ඇඳීමෙන් ය.

## භාවනාව හා ගැඹුරු දේව සබඳතාව

අවිලාහි ශු. තෙරේසා තුමිය හා ශ්‍රී කුරුසියේ ජුවාම් තුමාට එළිදරව් කළ දේව අභිරහස්, ශ්‍රී චණ කැළැල් පහ ලබා ගත් ශුද්ධවන්තයන් ප්‍රාතිහාර්යන් හා සුව කිරීම් මෙම ගැඹුරු දේව සබඳතාවයේ ප්‍රතිඵලයන් ය. මෙම ගැඹුරු දේව සබැඳියාවට මාර්ගය ජේසු සමිඳුන්ය. උන්වහන්සේගේ අබ්බා පියාණන් අත්දැකීම, අන්‍යරූපවිලාශ වූ අවස්ථාව දේව පුත්‍රභාවය ප්‍රකාශ වූ අවස්ථාවන්ය. නැතහොත් දෙවිඳුන් හා සම වූ අවස්ථාවන් ය.

'' මා පියාණන් වහන්සේ තුළද, පියාණන් වහන්සේ මා තුළද, සිටින බවට මාගේ වචන විශ්වාස කරන්න''. ජුවාම් 14/11.

''යාච්ඤා කරද්දී උන්වහන්සේගේ මුහුණුවර වෙනස් විය. උන්වහන්සේගේ වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබලිනි''.
ලූක් 9/30.
එසේ නම් ජේසු සමිඳාණන් වහන්සේ අප සැමට ආරාධනා කරන්නේ උන්වහන්සේ මෙන් දෙවිපියාණන් වහන්සේ සමග නිහඬ යාච්ඤාවේ යෙදෙන්නටයි. මා මුලින් සඳහන් කළ පවිත්‍ර වීම හෙවත් මනස්ථාපනය වීම ක්‍රියාත්මක කළ යුත්තේ නිහඬ යාච්ඤාව කරන භාවනාව තුළදී පමණක් නොව අපේ දෛනික ජීවිත තුළින් ය. එවිට භාවනාව තුළින් දෙවි පියාණන් හා සම්බන්ධවීය හැක. භාවනාවක් කරමු.

1. නිහඬ සුදුසු ස්ථානයක් තෝරා ගන්න. කොන්ද කෙලින් තියාගන පහසු ක්‍රමයකට බිම හෝ පුටුවක වාඩිවන්න. ඇස් දෙක පියාගන්න. බාහිර ශබ්දවලට සවන් දෙන්න ඔබගේ හුස්ම කෙරෙහි මද වේලාවක් අවධානය යොමු කරන්න. හුස්ම සමග රිද්මයකට ජේසුගේ නම කියන්න. සම්පූර්ණ අවධානය ජේසුගේ නමට පමණක් දෙන්න. ජේසුගේ නම කියන ගමන් උන්වහන්සේගෙ රූපය මවා ගන්න. කිසිදු කලබලයකින් තොරව ජේසුගේ නම සහ රූපය කෙරෙහි ඇති අවධානය හෙමින් හෙමින් අමතක කර ගැඹුරු නිහැඬියාවක රැඳෙන්න. (සමාධිගතවීම හා දේව සබැඳියාව) අවධානය බිඳෙන හැම මොහොතකම ජේසුගේ රූපය මතක් කරගෙන හෙමිහිට අමතක කරන්න. භාවනාව තුළදී කිසිම දෙයක් සිතන්න එපා. වර්තමාන මොහොතට පමණක් අවධානය යොමු කරමින් සෙමින් සෙමින් ඔබගේ ඇතුලාන්තය කරා ගමන් කරන්න. මෙම ඇතුළාන්ත ගමන තුළ ඔබට දෙවිඳුන්ව ගැඹුරු අත්දැකීමක් කර ගත හැක. කෙතේ සඟවා ඇති නිධානය මිලදී ගන්නට සියල්ල විකුණු මිනිසා මෙන් ඔබත් දේව සබඳ තාව ගොඩනගා ගන්න උත්සහ කරන්න මෙම පෞද්ගලික නිහඬ යාච්ඤාව තුළින් සාර්ථක ධර්මදූත සේවාවක්ද ඒ තුළින් දේව ජනතාව ගැඹුරු අධ්‍යාත්මික ජීවිතයකට යොමු කරමින්, අප පතන ''සාමය'' ලඟා කර ගත හැක.

ගුරු ශිරෝමා ප්‍රනාන්දු පැව්දි සොයුරිය

# කැපවීම




ආදරණීය දුවේ පුතේ, අද මම ඔබත් සමග බෙදු හදු ගන්න යන්නේ කැපවීමේ ඇති වටිනාකම පිළිබඳව කියවෙන සත්‍ය කථාවක්.

මගේ සහෝදරියව මීට සති කීපයකට පෙර මීගමුව රෝහලේ හදිසි ශල්‍යකර්මයකට භාජනය කළා. ශල්‍යකර්මය කළ දිනය මුළු දවස පුරාම රෝහල් පරිශ්‍රය තුළ රැඳී සිටින්නට මා තීරණය කළා. මොකද හදිසි තත්ත්වයක් මතුවුවහොත් රෝගියාගේ පාර්ශවය පැත්තෙන් අවශ්‍ය සහයෝගය ලබා දිය යුතු නිසා. පාන්දර 6 වන විට අදාළ වාට්ටුවට යන විටත් වාට්ටුව භාර වෛද්‍යවරයා තමාගේ රාජකාරිය ආරම්භ කරලා. අදාළ වාට්ටුවේ සිටින සියලුම රෝගීන් පරීක්ෂා කරමින් අදාළ නිර්දේශයන් සටහන් කරමින් පැය කීපයක් වාට්ටුව තුළ තම රාජකාරී කටයුතු සිදු කළ වෛද්‍යතුමා අනතුරුව පිටත්ව ගියේ ශල්‍යාගාරය වෙතය.

මගේ සොහොයුරියවද ශල්‍යාගාරය වෙත රැගෙන ගිය නිසා මමද 7 වන මහලේ පිහිටා ඇති ශල්‍යාගාරය අසලට විටින් විට ගමන් කළා. මේ අවස්ථාවේදී මා දුටුවා එක්තරා වෛද්‍යතුමකු ශල්‍යකර්මයකට නියමිතව සිටි රෝගියකුගේ නියමිත වෛද්‍ය වාර්තාවන් ප්‍රමාද වී තිබු නිසා ඔහු හනික ලහි ලහියේ පහත මාලයට දිව ගොස් අදළ වාර්තාවන් රැගෙන එන්නට යුහුසුළු වනවා. මෙහිදි තමාගේ රාජකාරිය නොපිරිහෙලා ඉටු කරමින් අන් අයගේ යම් යම් අතපසු වීම් සිදු වන විට අවලාද නොකියා එම කටයුතු සිදු කිරීම සැබවින්ම ප්‍රශංසනියය
රෝගින්ගේ දිවි බේරා ගැනීමට රෝගින් සුවපත් කර ගැනිමට ඔවුන් වන මහන්සිය කැපවීම පරිත්‍යාගය, අගය කළ යුතුය. එම නිසා අපි සැම විටම මෙම වෛද්‍යතුමන්ලාට අවලාද නගන්නට නොව මොවුන් කරන සේවය කැපවීම අගය කරන් නටද අවස්ථාවන් උදා කර ගන්නේ නම් කොයි තරම් හොඳද

පී.ඒ. නිමාලි ප්‍රනාන්දු ගුරු මව

## මාසික සිතිවිල්ල

මාසික සිතිවිල්ල



සේයා :-
ශ්‍රියාංගණී පිලිෂියා

"ඔක්තෝබර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, , ඥානාර්ථ ප්‍රදීපය
මාවත, කොළඹ 08.

# රචනා තරගයෙන් ජය ලබයි



කොළඹ අගරදගුරු පදවියේ ධර්මදූත ළමා සමාජයට වසර 25 ක් පිරීම නිමිත්තෙන් පැවති තරගවලින් රචනා අංශයේ තෙවන ස්ථානය ලබා ගැනීමට දියලගොඩ මීසමේ ධර්මදූත ළමා සමාජයේ බ්‍රිඩ්නි කවිතා දැරිය සමත් වීය.

ඇය පයාගල සුරදූතිකා බාලිකා පාසලේ 6 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නිය. ඇයට හිමි සහතික පත්‍රය සමඟ ළමා ප්‍රදීපය කැමරාවට පෙනී සිටි අයුරු. (**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

# සළනියෙ 20 වන සැමරුම



සන්තානා ළමා නිවාසයේ (ස.ළ.නි.) 20 වන සංවත්සර සැමරුම් උත්සවය පසුගියදා තුම්මෝදර ළමා නිවාසයේදී පැවැත්වුණි. හලාවත රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මේ සඳහා ගරු පියතුමන්ලා ඇතුළු ආරාධිතයෝ රැසක් සහභාගි වූහ.

මෙහිදි සළනියේ 20 වසරක ගමන්මඟ අළලා සැකසු රූපරාමු පෙළ සැමගේ අවධානය දිනීය. මෙය ඉදිරිපත් කළේ ජෙරොම් ඇන්තනි මහතාය. මෙදින තුම්මෝදර, ලුණුවිල හා දෙමංහන්දිය ළමා නිවාසයන් හි ළමුන්ගේ විශේෂාංග රැසකින් සමන්විත වුණි. සළනි නිර්මාතෘ ගරු ප්‍රෑන්ක් තිසේරා පියතුමාගේ අනුශාසකත්වයෙන් මෙහි කටයුතු සංවිධානය කෙරිණි. නිර්මාතෘ පියතුමාගේ උපන්දිනය ද මෙදින සැමරිනි. ළමුන්ගේ කුසලතාවයන් ඉදිරිපත් වූ අවස්ථාවක් මෙහි දිස්වේ.

**සේයා - ගොඩ්ෆි අබේසේකර , සටහන - ප්‍රියන්ත පීටර්ස්**

# මව් සෙනෙහස

උණුසුමක් කොහිවේ ද
මව් තුරුලෙන් ලද තරම්.........
සැනසුමක් කොහිවේ ද
මව් උකුලේ නැළවුනු තරම්.......

සෙනෙහසක් කොහිවේ ද
මව් සෙනෙහස තරම්.....
ණයගැතිකමක් කොහිවේ ද
මව් පෙව් කිරි වල තරම්......

**සජානි ප්‍රනාන්දු (ආචාර්ය මඩුල්ල)**
සා. සෙබස්තියන් දහම් පාසල
කටුනේරිය

## සොබාදම් අසිරිය

කන්ද උඩින් හැංගි හිරු පායන්නා
කුරුළු ගීත හැම අතේම පැතිරෙන්නා
පිනිපොද ගසා රුක් අතු සැම සෙලවෙන්නා
සැමදෙනාම හරි සතුටින් හිනැහෙන්නා

ලාහිරු කිරණ මිහිකත වෙත ගෙනඑන්නෙ
රන්හිරු රැසින් මුළු ලෝකය බබලන්නේ
තුරුවදුලු සෙවනේ පුංචි කැකුළු හිනැහෙන්නේ
සොඳුරු උදය හැඩ කරමින් නැලවෙන්නෙ

**විඳුනි හෙට්ටිආරච්චි**
9 ශ්‍රේණිය
ආවේ මරියා බාලිකා විදුහල
මීගමුව






## සුන්දර ළමා විය

මල් සමනලුන් පස්සේ රෝස පාට බෝනික්කන්
අතරේ රැඳුණු සුන්දර ළමා විය
හරි ඉක්මනට ගෙවිලා ගිහින් නංගියේ මල්ලියේ
ඒ අතීතය එක්කම
ඒ දවස්වල හිතේ තිබුණ
පුංචි පුංචි අහිංසකකම් බොලඳ කම් සුරතල්කම්
අමතක කරලා දාන්න එපා නංගියේ මල්ලියේ

**චාරුනි සෙව්වන්දි**
11 ශ්‍රේණිය
සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසල - පයාගල







## වඳිමි ඔබ දෙපා

අවවාදයෙන් නොව ආදර්ශයෙන් මට ජීවිතය කියාදුන්
සැමහට තමන්ගේ ජීවිතය බෙදා දුන්
මව්නි ඔබව රැක ගන්නට ප්‍රාර්ථනා කරමින්
වඳිමි ඔබේ දෙපා මා දෙවිඳුන්ට තුති දෙමින්

**ජුඩිත් නෙෂානි ප්‍රනාන්දු**
06 ශ්‍රේණිය
සාන්ත නිකුලා දහම් පාසල
මුන්නක්කරය - (මහවීදිය මීසම)

## දහම් පාසල

දහම් දැනුමෙන් අපව පෝෂණය කර
යහපත් ගුණාංග අප තුළ ඇති කරමින්
යහ මඟ කරා ගෙන යන දහම් අම්මා ඔබයි
ජීවිත යහ මඟට ගෙන යාමට කියා දුන්
ආදරණීය දහම් අම්මේ
සදා ණය ගැතියි අපි ඔබට

**හිරුණි මධුශිකා**
08 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල - බටගම



## හෙට ලොව

ගොඩනගනට හෙට ලොව අප දැතින්
අඳුරු වූ තිමිර පටලයට ඇතින්
බාධා බිඳදා දෙගුරුන් ස්නේහයෙන්
අත් වැල් අල්ලා කිතු දම් නාමයෙන්

**ඉනේෂා සඳුමිණි වික්‍රමාරච්චි**
09 ශ්‍රේණිය
කිතු දහම් පාසල - පල්ලන්සේන

## හිමිදිරි උදෑසන

හිමිදිරි උදයේ හිරු මාමා පායලා අප සතුටු කරන්නේ
අපි හිනැහෙනවා එතකොට මල් හිනැහෙන්නේ
වළාකුළුත් අහස පුරා විසිරී යන්නේ
ලස්සන කුරුල්ලෝ පියඹා යන්නේ
අපි දැතට මල් අරගෙන ජේසු වඳින්නේ

**සරෝනි මලින්ති**
03 ශ්‍රේණිය
යහපත් එඬේරාගේ කන්‍යාරාමය - කොළඹ 13



## ආදර දෙවිඳුනි

සුළඟේ ලෙළෙනා කුසුමක්සේ
අහසේ දිලෙනා තරුවක්සේ
සයුරේ නැගෙනා රැල්ලක්සේ
පිබිදෙයි සිතිවිලි සිත් අහසේ
සිතුවිලි පිබිදි සිත් අහසේ
ගෙනදෙයි ජීවය නිති රහසේ
දෙවිඳුනි ඔබමයි නිති සරණේ
සැමදා මා දිවි රැකවරණේ



**සජින්තා ජයලක්මි පෙරේරා**
12 ශ්‍රේණිය
සා. රීටා දහම් පාසල - මා එළිය

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## ක්‍රිස්තියානි යාච්ඤාව

**01. යාච්ඤාව යනු කුමක්ද**

**1. යාච්ඤාවේ විවිධ ස්වරූප දෙකක් නම් කරන්න**
- ★ මිනිස් ජීවිතයේ දුක හා සතුට දෙවිඳුන් හා බෙදා ගැනීමකි.
- ★ මිනිස් අවශ්‍යතා පතා දෙවිඳුන් වෙත කෙරෙන ඉල්ලීමකි.

**2. ශුද්ධවූ සභාවේ යාච්ඤා වර්ග (ප්‍රභේද) දෙකක් නම් කරන්න.**
★ වාචික ★ භාවනා

**3. ඔබ පවුලේ සැම දෙනා එක්රැස් වී දිනපතා යාච්ඤා කිරීම කුමන යාච්ඤා වර්ගයට අයත් වේද?** ★ සාමූහික යාච්ඤාව

**4. ශුද්ධවූ සභාවේ නිල යැදුම ලෙස හැඳින්වෙන්නේ**
★ යාම යැදුමයි

**5. කිතුනුවන් යාච්ඤා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ.**
★ දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාව තහවුරු කර ගැනීම ය.

**6. යාච්ඤාවේ කැපී පෙනෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න**
- ★ සමිඳුන්ට ප්‍රශංසා කිරීම
- ★ දේව නමස්කාරය
- ★ දෛනික ඉල්ලීම්

**7. යාච්ඤාව ජීවිතයට ඒකාබද්ධ කර ගැනීමෙන්**
★ දේව කැමැත්තට අනුව තම වගකීම් ඉටු කිරීමට ධෛර්ය ලැබේ.

**8. කෙටි සටහන් ලියන්න "පෞද්ගලික යාච්ඤාව"**
- ★ යාච්ඤාව යනු දෙවියන් වහන්සේ හා මිනිසා අතර පවතින විශ්වාසයේ සංවාදයයි.
- ★ යාච්ඤාව පෞද්ගලික හා පොදු වශයෙන් කොටස් දෙකකි
- ★ පෞද්ගලික යාච්ඤාව යනු තනි තනිව යාච්ඤා කිරීමයි.
- ★ පෞද්ගලික යාච්ඤාව අප ජීවිතයට අත්‍යවශ්‍ය අංගයකි.
- ★ පෞද්ගලික යාච්ඤාව තුළින් එදිනෙදා ජීවිතයේ ප්‍රශ්න හා අභියෝගවලට මුහුණ දීමට ශක්තිය ලැබේ.
- ★ එසේම දෙවියන් වහන්සේ අප තුළ වැඩසිටින බව ගැඹුරින් අවබෝධ කර ගත හැකි අතර, ජීවිතයේ සතුට හා වේදනාත්මක අත්දැකීම් එකලෙසින් භාර ගැනීමට පෞද්ගලික යාච්ඤාව තුළින් විශේෂ අනුබලයක් ලැබේ.
- ★ ජේසුස් වහන්සේ ද පෞද්ගලිකව යාච්ඤා කළ අවස්ථා කිහිපයක් සුභාරංචි තුළ දැක්වේ.
- ● හිරු උදාවීමට බොහෝ කලින් උන්වහන්සේ අවදිව හුදකලා තැනකට ගොස් යාච්ඤා කළ සේක.
- ● ජනකාය යැවූ පසු උන්වහන්සේ කන්දකට නැගී මුළු රැය පුරා දෙවියන් වහන්සේට යාච්ඤා කළ සේක.

**පුරාණ ගිවිසුම තුළ යාච්ඤා**

**9. පුරාණ ගිවිසුමේ යාච්ඤාව පිළිබඳ විශිෂ්ටතම කෘතිය කුමක්ද?**
★ ගීතාවලිය

**නව ගිවිසුම තුළ යාච්ඤාව**

● ජේසුස් වහන්සේගේ යාච්ඤාව

**10. තම ජීවිතය එකම යාච්ඤාවක් බව යම් කෙනෙකුට කිව හැකිව තිබුණා නම් එසේ කීමට හැකි වනුයේ.**
★ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේහටය

**11. දෙවි පියාණන්ට කෙලෙස යාච්ඤා කළ යුතුදැයි පෙන්වා දීමට ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමා දෙකක් නම් කරන්න.**
- ★ පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව
- ★ වැන්දඹුව හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව

**12. නොකඩවා යාච්ඤා කිරීමේ අගය පෙන්වා දෙන උපමාව වන්නේ**
★ වැන්දඹුව හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව

**13. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤාවෙහි යෙදිය යුතු බව දක්වන පිණිස ජේසුස් වහන්සේ වදාළ උපමාව නම්.**
★ වැන්දඹුව හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව

**14. යාච්ඤාව සම්බන්ධව ක්‍රිස්තුන් වහන්සේ විසින් වදාළ උපමා දෙකක් නම් කරන්න.**
★ පරිසිවරයා හා අයකැමියා ★ වැන්දඹුව හා විනිශ්චකාරයා

**15. ජේසුස් වහන්සේ පෞද්ගලිකව යාච්ඤා කළ අවස්ථා දෙකක් ලියන්න**
- ★ ශ්‍රාවකයින් දොලොස්දෙනා තෝරා ගැනීමට පෙර
- ★ ප්‍රාතිහාර්යන් කිරීමට පෙර යාච්ඤා කිරීම

**16. ගෙත්සමෙනි උයනේ දී ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයින්ට අවවාද කළේ.**
★ පරීක්ෂාවට නොවැටෙන ලෙස යාච්ඤා කරන්න යැයි කියා ය.

**17. ජේසුස් වහන්සේ ඔලිව් කන්දේ දී ශ්‍රාවකයන්ගෙන් ඉල්ලා සිටියේ කුමක්ද?**
★ පරීක්ෂාවට නොවැටෙන ලෙස යාච්ඤා කරන ලෙසය.

ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 27

## මැරෙන තුරු ජීවිත රහස හෙළි නොකළ ලෝක මහ ක්‍රිස්තියානි සංගීතඥයා

කඳු ලොවේ උසස්ම කඳු මුදුන හිමාලයේ ඇත. ලොවේ ඇති ගංගා අතුරින් දිග ම ගඟ මිසිසිපිය. පැසිපික් සයුර පමණ විශාලතම සයුරක් තවත් ලොවේ නැත. සිව් පා ලෝකයේ සිංහයා රජවේ. ඉංග්‍රීසි ලේඛක කලාවේ මුල් තැන විලියම් ෂේක්ස්පියර් සතුවේ. ගුවන් විදුලි යන්ත්‍රයේ අමරණීය නාමය දරන්නා මාර්කෝනි ය. කපන, කොටන, අඳින, අඹන කලා ලොවේ උසම පුටුව මයිකල් ආන්ජලෝට අයිති ය. මේ බඳු සීයක් දිග නාමා වලියක් ලිවිය හැක. මෙම රචනයෙන් ළමා ඔබට අප හඳුන්වා දෙන්නට යන්නේ, වෙසෙසින් ම ගැයුමට හිතැති අය ගරු කරන සංගීතය ශාස්ත්‍ර ක්‍රමයෙන් (ප්‍රස්තාර මගින්) හදාරන අය බැතියෙන් හිස නමන, ලෝ පූජිත අරුම පුදුම ලුඩ්විග් වැන් බිතෝවන් නම් මහා සංගීත රාජයා ගැන ය.

ඔහු සංගීත ලෝකයට ලියා කිය දුන් ගයා වයා නෙක නෙක අංශයේ නෙක නෙක අංගයේ අමරණීය සංගීත රාශියක මානසික ශාරීරික තෙහෙට්ටුවෙන් පීඩා විඳින කඩිසර කරදර කලබල ලෝ සමාජයට ක්ෂෙම භූමියකි, සිසිල් පවනකි, පවන් සැලුමකි, ශාන්ත මිහිරකි, සනීපදායක විවේකයකි, පැරදුම අමතක වීමෙකි, පොලොවෙන් ඉහලට නැඟීමෙකි. කෙමෙන් කෙමෙන් නොදැනී ම ගුවනට ඉගිලීමෙකි. තවද බිතෝවන්ගේ සංගීත කලාව පමණ ම ප්‍රයෝජනවත් වූ දැය, ඔහුගේ ජීවන චරිතයෙන් අපට උපුටා ගත හැකි බැවින් මෙම ලිපිය සංගීත ලෝලයන්ට පමණක් නොව ජීවිතය නමැති මරු කතරේ ගමන් ගන්නා අප සෑම දෙනට ම වැඩ දායක විය යුතුය. මිනිස් දිවියේ ඉමිහිරියාව සුගන්ධය ප්‍රේමය, සාමය , විනෝද ආදි දැය සංගීතයෙන් බිතෝවන් ලොවට දානය කළේ ජිවිත තිත්ත කාඩි පාත්‍රය නිතර පානය කරමිනි. බොහෝ විට වැරදුමට පැරදුමට බැරි කමට නැති කමට ලෙඩ බවට , ගොදුරු වීමෙන් හිස නැමීමෙනි. ඉතා වටිනා උසස් නොවරදින සුලු ගුරුවරයා වනාහි ජිවිතයේ අත් දැකීම් නොහොත් පල පුරුද්ද කියා කීවොත් වැරදි නැත කියා අපි සිතමු.

එහෙත් අත් දැකීමෙන් හා පළ පුරුද්දෙන් ඉගෙන ගන්නා තැනැත්තා ලොකු කුඩා මහා පරිත්‍යාග බවට මැදි විය යුතු බව යට විය යුතු බව මෙම මහා ගාන්ධර්වයා ගේ ජීවිත පොත අපට හෙළි පෙහෙළි කර දෙන්නේ ය. දස නම වැනි ශත වර්ෂයේ මුලාරම්භයේ දී ජර්මනිය පමණක් නොව මුලු යුරෝපා රාජ්‍යය සංගීතාලෝකයෙන් ආලෝක කළේ, ජීවනයේ මිහිර පදයට බැන්දේ තාලයට ගෙතුවේ, පියානෝවෙන් වීණාවෙන් මහා රෞකිඤ්ඤදයෙන්, කුඩා රෞකිඤ්ඤ යෙන් බටනලාවෙන් ඉමිහියෙන් සුන්දරයෙන් සුකොමලයෙන් සුවිනීතයෙන් සුනිමලයෙන් ගැයුවේ කවුද?

මේ අහන්න. හත් අට මසකටවත් කතුරක තෙල් ටිකක පනාවක ආධාරයක් නොලැබ කාක් කූඩයකට බඳු පොකුටු කෙස් කලඹකින් යුත් ලොකු හිසක් ඇති, හැඩි දැඩි තරබාරු ගතින් ද, දිග මහත ඇඟිලි ඇති අතින් ද වටකුරු කුඩා නිල්පාට ඇසින්ද , යුත්. කිලිටි ඉරුණ ලාබ ඇඳුමකින් සැරසුණු කරුණාවන්ත කමට වැඩිපුර නෑ කම්නො කී, හදිසියෙන් කෝප වී නයෙකු ලෙස පෙනේ පුම්බන, සාමාන්‍ය සමාජ සිරිත විරිතට ගරු නොකළ , අලංකාර සිරුරක අයිතිය නො හිමි වුන තරුණ බිතෝවන් විය. පියානෝව ඉදිරිපිට වාඩි වූ විට (ඔහු) දෙකකුල් කොහේ තිබේද කියා ඔහුටවත් දැනුනේ නැ. බමරයක් ලෙස හිස කැරකුණේය. දෙ අතේ ඇඟිලි යන්ත්‍ර බලයෙන් ලෙස ක්‍රියා ශීලි වූවෝය. පියානෝ හඬ අහසට ගිගුම් දුන්නේය. වියලි කැලයක් ගිනිගත් විට ගින්න දස දෙස ඇවිලෙන්නා සේ පියානෝ හඬ ඉසිරී විසිරී පැතිරී ගියේය.


ලුඩ්වින් වැන් බිතෝවන්

ඔහු දෙස බලා සිටි අය ද වාදනයට , ගායනයට ඇහුම් කන් දුන් අය ද ගල් ගැසී ඇන ගැසී සිතුම බැරි වී කතාව එපා වී, සිටි තැන, වාඩි වූතැන, කොතැන ද කියා අමතක වී මිහිරි නාදය රාගය තාලය සමගම මනැසින් ඉහලට ම ඉගිලුනෝ ය. සංගීත ශාස්ත්‍රයට එකඟව පොතේ තිබුණු සැටියට ප්‍රස්තාර සියල්ල ම ඔහු දැනගත් නමුත්, බොහෝ විට ඒවා යේ නිතී රිති පිළි පැද්දේ බිතෝවන් නොවේ. පොත වැරදිය කියා සිතා විදුලිය බඳු කඩිසර බවින් අලුත් ප්‍රස්තාර ඒ වෙලේ ම මවා ගැයුවේ ය. අසන දකින අය ඔහු ගයන වයන සියල්ල හරිය කියා අත් පොලසන් දුන්නෝ ය. සංගීත ශාස්ත්‍රයේ ඉතා උසස් තලෙන්තු (**Genius**) සහජ උතුම් බුද්ධිය මෙලොව උපන් යමෙකුට ඉතා සුලභව ලැබුණෝ නම් එබඳු වාසනාවන්තයා බිතෝවන් විය.

ජර්මනියේ බොන් නමැති අප්‍රසිද්ධ ග්‍රාමය මෙම සංගීත ශූරයාගේ උපන් බිම විය. ඔහු මේ ලොව එළිය දුටුවේ ක්‍රිස්තු වර්ෂ 1770 දීය. ඔහුගේ පියා මහා බේබද්දෙකි. උපයන දෙය සූදු කෙලියට හා බීමට වියදම් කළේය. පවුල ගැන සැලකුවේ නැත. කොලෝන් නුවර නගරාධිපතියා ගේ මාලිගයේ සෑම ඉරුදිනක ම සවස පැවැත්වුන සංගීත උළෙලට ඔහු සහභාගි වූයේ ය. එනුවර රදළ පවුලකට ආහාර පිසූ ප්‍රධාන අරක්කැමියාගේ වැඩිමහල් දුව වූ ජොහානා, අප සංගීත රාජයා ගේ මව වූ, ඈ ක්ෂය රෝගයෙන් පෙලුනු තැනැත්තියකි.

**සංස්කාරක පියතුමන් විසිනි**

**ඉදිරියට .......**

කිතුනු උරුමය

# රට රටවල කතෝ

| රට | කතෝලික පිරිස | මුළු ජනගහණය | ප්‍රතිශතය | රදගුරු පදවි | පදවි පු |
|---|---|---|---|---|---|
| රුමේනියාව | 1,875,000 | 21,709,000 | 8.64% | 12 | 1,551 |
| පැනමාව | 1,799,000 | 2,107,000 | 85.38% | 8 | 199 |
| පැපුවානිව් ගිනියාව | 1,688,000 | 4,968,000 | 33.98% | 19 | 185 |
| බෙනින් | 1,646,000 | 7,155,000 | 23.00% | 10 | 394 |
| ස්ටොවැනියාව | 1,623,000 | 1,997,000 | 81.27% | 3 | 854 |
| බුකිනා ෆාසෝ | 1,545,000 | 13,169,000 | 11.73% | 13 | 559 |
| ටෝගෝ | 1,483,000 | 5,968,000 | 24.85% | 7 | 321 |
| ශ්‍රී ලංකාව | 1,364,000 | 20,204,000 | 6.75% | 11 | 648 |
| ය්මනය | 1.300,000 | 47,760,000 | 2.72% | 1 | 9 |
| සිම්බාබ්වේ | 1,282,000 | 14,580,000 | 8.79% | 8 | 183 |
| පාකිස්තානය | 1,191,000 | 165,809,000 | 0.72% | 7 | 122 |
| බෙලරුසියාව | 1,030,000 | 10,310,000 | 9.99% | 4 | 214 |
| ලෙසොතෝ | 971,000 | 1,811,000 | 53.62% | 4 | 67 |
| මධ්‍යම අප්‍රිකා ජනරජය | 793,000 | 3,492,000 | 22.71% | 9 | 139 |
| රුසියානු සමුහාආණ්ඩුව | 789,000 | 147,125,000 | 0.54% | 5 | 126 |
| මැලේසියාව | 784,000 | 24,740,000 | 3.17% | 8 | 179 |
| නැගෙනහිර තිමෝරය | 767,000 | 823,000 | 93.20% | 2 | 44 |
| චාඩ් | 720,000 | 8,178,000 | 8.80% | 8 | 131 |
| ඕෂනියාව | 703,000 | 2,500,000 | 28.12% | 17 | 213 |
| සෙනගාලය | 673,000 | 10,357,000 | 6.50% | 7 | 267 |
| ගැබොන් | 615,000 | 1,325,000 | 46.42% | 6 | 57 |
| මියැන්මාරය | 603,000 | 58,304,000 | 1.03% | 12 | 515 |
| රි යුනියන් | 595,000 | 645,000 | 92.25% | 1 | 58 |
| නිරක්ෂ ගයනාව | 548,000 | 586,000 | 93.52% | 3 | 63 |
| සර්බියාව හා මොන්ටෙනිග්‍රෝ | 541,000 | 9,878,000 | 5.48% | 7 | 205 |
| ඉතියෝපියාව | 533,000 | 59,862,000 | 0.89% | 10 | 189 |
| ජපානය | 509,000 | 127,851,000 | 0.40% | 16 | 501 |
| බොස්නියාව සහ හෙර්සිගෝවියන | 464,000 | 2,981,000 | 15.57% | 3 | 266 |
| නවසීලන්තය | 459,000 | 3,945,000 | 11.63% | 7 | 317 |
| කේප් වර්ඩ් | 432,000 | 465,000 | 92.90% | 2 | 17 |
| ලැට්වියාව | 430,000 | 2,381,000 | 18.06% | 4 | 108 |
| සිරියාව | 425,000 | 1,000,000 | 42.50% | 17 | 199 |
| ඉරාකය | 414,000 | 3,500,000 | 11.83% | 15 | 142 |
| ලක්සම්බර්ග් | 388,000 | 448,000 | 86.61% | 1 | 180 |
| නැමීබියාව | 375,000 | 2,235,000 | 16.78% | 3 | 19 |
| මොල්ටාව | 368,000 | 386,000 | 95.34% | 2 | 477 |
| මොරිෂියස් | 310,000 | 1,178,000 | 26.32% | 2 | 61 |
| තායිවානය | 303,000 | 22,158,000 | 1.37% | 7 | 226 |

# ලික ජනගහණය

ශිරාන් මෛත්‍රි විසිනි

| ක | නිකායික පූජක | මුළු පූජකවරු | ස්ථිර තේවාචාරීන් | පැවිදි (පිරිමි) | පැවිදි (කාන්තා) | මීසම් |
|---|---|---|---|---|---|---|
| | 182 | 1,733 | 4 | 437 | 1,326 | 1,430 |
| | 197 | 396 | 64 | 270 | 447 | 186 |
| | 328 | 513 | 7 | 672 | 861 | 305 |
| | 107 | 501 | - | 227 | 939 | 212 |
| | 296 | 1,150 | 8 | 372 | 741 | 803 |
| | 157 | 716 | - | 491 | 1,218 | 141 |
| | 127 | 448 | - | 337 | 735 | 151 |
| | 307 | 955 | - | 626 | 2,300 | 391 |
| | 36 | 45 | 1 | 36 | 64 | 20 |
| | 220 | 403 | 12 | 528 | 1,049 | 208 |
| | 112 | 234 | 1 | 208 | 662 | 114 |
| | 157 | 371 | - | 207 | 354 | 402 |
| | 80 | 147 | - | 150 | 653 | 86 |
| | 138 | 277 | - | 189 | 334 | 114 |
| | 142 | 268 | 3 | 193 | 309 | 426 |
| | 48 | 227 | 1 | 101 | 558 | 142 |
| | 69 | 113 | - | 195 | 289 | 37 |
| | 111 | 242 | - | 157 | 375 | 109 |
| | 260 | 473 | 141 | 463 | 837 | 345 |
| | 127 | 394 | - | 336 | 719 | 125 |
| | 61 | 118 | 1 | 95 | 167 | 64 |
| | 29 | 544 | - | 159 | 1,454 | 290 |
| | 52 | 110 | 13 | 86 | 505 | 75 |
| | 45 | 108 | 2 | 86 | 208 | 69 |
| | 46 | 251 | 7 | 57 | 319 | 265 |
| | 289 | 478 | 1 | 461 | 596 | 246 |
| | 1,088 | 1,589 | 12 | 1,407 | 6,263 | 848 |
| | 361 | 627 | 1 | 437 | 499 | 276 |
| | 201 | 518 | 9 | 366 | 944 | 271 |
| | 35 | 52 | - | 42 | 134 | 31 |
| | 27 | 135 | 1 | 32 | 109 | 267 |
| | 77 | 276 | 12 | 96 | 375 | 227 |
| | 37 | 179 | 9 | 71 | 424 | 119 |
| | 68 | 248 | 7 | 80 | 566 | 275 |
| | 63 | 82 | 45 | 97 | 399 | 91 |
| | 448 | 925 | - | 524 | 1,047 | 79 |
| | 40 | 101 | - | 74 | 244 | 49 |
| | 479 | 705 | - | 644 | 1,056 | 452 |

ඉදිරියට .......



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 112

## "It's high time" / "It's about time"

### අභ්‍යාසය

8. වහින්න යන්නෙ. අපි කුඩයක් අරගෙන යමු.
It's going to rain. We ....... an umbrella.

9. බස් එක පරක්කු වැඩියි. ටැක්සියක යන්න.
You ..... in a taxi. The bus is too slow.

10. ඔබේ ජංගම දුරකථනය නැති වුනා නම් පොලීසියට කියන්න. (කිව්ව නං හොඳයි)
You ....... the police, if you lost the mobile phone.

11. ඔයාට අසනීප වගේ. අද වැඩට ගියෙ නැත්තං හොඳයි.
You look sick today. You ....... to office today.

12. විදුලි බිල ගෙවන්න. (ගෙව්ව නං හොඳයි) නැත්තං ලයිට් කපයි.
You ..... the electricity bill. They may disconnect the power supply.

13. මේ විස්කෝතු හරි හොඳයි. කාල බලන්න. (කාල බැලුව නං හොඳයි)
These biscuits are delicious. You ...... try one.

14. කාන්තිට මඟුල් ගෙදරට ආරාධනා නොකළොත් “අප්සෙට්” වෙයි. එයාටත් ආරාධනා කළා නම් නේද හොඳ?
Kanthi will be upset if you don't invite her for the wedding.
You ............her.

**පහත සඳහන් අවස්ථාවලට උචිත ලෙස It's time යොදා වැකි හදන්න.**

15. ළමයි මේ වන විට ඇඳේ සිටිය යුතුයි. දැන් රෑ එකොළහයි.
Children should be in bed. The time is 11 'o' clock.

16. මේරි ප්‍රමාදයි. ඇය දැන් ඇවිත් සිටිය යුතුයි.
Mary is late. She should be here.

### පිළිතුරු

1. I need some money. I'd better **go** to the bank.
2. Sunimal is waiting for your call. You **had (you'd)** better call him.
3. Shall I open the window? No, you **had better (you'd better)** leave it open.
4. The train is at one 'O' Clock. You **had** better **go** now.
5. It's time the government **did** something about the problem.
6. I think it's about time you **got** (get) the driving licence.
7. Don't you think it's about time you **got** (get) married?
8. It's going to rain. We **had better take (we'd better take)** an umbrella.
9. You **had better go (you'd better go)** in a taxi. The bus is too slow.
10. You **'d better inform** the police, if you lost the mobile phone.
11. You look sick today. You'd **better not go** to office today.
12. You'd **better pay** the electricity bill. They may disconnect the power supply.
13. These biscuits are delicious. **You'd better try** one.
14. Kanthi will be upset if you don't invite her for the wedding.
**You'd better invite** her.

**පහත සඳහන් අවස්ථාවලට උචිත ලෙස It's time යොදා වැකි හදන්න.**

15. Children should be in bed. The time is 11 'o' clock.
**It's time the children went to bed.**

16. Mary is late. She should be here.
**It's time Mary came here.**





**සුනිමල දහම් පාසල වැලිවිට**

වැලිවිට සුනිමල දහම් පාසලේ සිසු සිසුවියෝ පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දේව මෙහෙය මීසම් සේවක ගරු අර්නස්ට් ද මෙල් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ගරු පියතුමන්ලා ළමුන් හා දරු දැරියන් සූදනම් කළ ගරු මේරි සෙලින් සහ ගරු මේරියන් ප්‍රනාන්දු පැවිදි සොයුරියන් ගුරුවර ගුරුවරියන්ද සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට මුහුණදුන් අවස්ථාව **එම්.ජෝ. පාරිස්**

**සන්ත ලුවිස් දහම් පාසල - කොටරූපේ**

රද්දොළුගම මීසමට අයත් කොටරූපේ සන්ත ලුවිස් දහම් පාසලේ ළමෝ 08 දෙනෙකු පසුගියදා කොටරූපේ සාන්ත ලුවිස් දෙව්මැදුරේදී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ.

අනතුරුව ළමුන් මීසම් සේවක ගරු ප්‍රසාද් පෙරේරා පියතුමන් දහම් ගුරුවරියන් සමඟ සමූහ ඡායාරූපයකට එක්වූ අවස්ථාවකි. **රන්ජිත් ලොකුපෝතාගම**



## තොඩුවාව දහම් ළමුන්ට විශේෂිත දෙසුමක්



තොඩුවාව මීසමේ දහම් පාසලේ 8 ශ්‍රේණියේ සිට ඉහල දූ පුතුන් සඳහා විශේෂිත දෙසුමක් පසුගියදා තොඩුවාව, රදගුරු අති උතුම් ප්‍රෑන්ක් මාකස් සමරූ ශාලාවේදි පැවැත්වුණි. ''යහපත් කිතුනු දරුවන් වෙමු අපි '' තේමාව යටතේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා මෙම දෙසුම මෙහෙයවනු ලැබිය.මෙයට ගීත භාවනාවක්ද ඇතුලත් වුණි.

තොඩුවාව මීසම් සහයක ගරු දුෂාන්ත පෙරේරා පියතුමන්ගේ අදහසකට අනුව මීසම් සේවක ගරු ඉයුජින් සිල්වා පියතුමන්ගේ මඟ පෙන්වීම යටතේ දහම් ගුරු භවතුන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරිණි. ළමුන් ගීත භාවනාවට එක් වූ අයුරු මෙහි දිස්වේ.

## සතුන්ගෙන් ලබාගන්නා ඖෂධ



ආදර දුවේ පුතේ, අපි පංතියේ පාඩම්වල දී ඉගෙන ගන්නවනේ සතුන්ගෙන් ලබා ගන්නා ප්‍රයෝජන ගැන. ඒ අනුව මස්, කිරි, බිත්තර ආරක්ෂාව යනුවෙන් ඉගෙන ගත්තා ඒවාට අමතරව විශේෂ ප්‍රයෝජන රැසක් අපට ලැබෙන අයුරුයි මේ. ලොඩ රෝග සුවකරන්න අවශ්‍ය ඖෂධ රාශියක්ම සතුන්ගෙන් ලබාගන්නා බව අහලා තියෙනවාද?.

හදවතේ රෝග සුවකිරීමට ගන්නා ''එපිනෝන්රින්'' කියන බෙහෙත ලබා ගන්නේ බළලුන්ගෙන් සහ ඌරන්ගෙන්. ඒ බෙහෙත සොයා ගත්තේ ක්‍රි.ව. 1904 දී. එම බෙහෙත ඇදුම රෝගීන් සඳහාත් භාවිත කරනවා. බෙල්ලේ තයිරෝයිඩ් ග්‍රන්ථිය ආශ්‍රිත රෝග සඳහා භාවිත කරන තයිරොක්සින් නම් ඖෂධය ලබා ගන්නේ බළලුන්ගේ තයිරෝයිඩ් ග්‍රන්ථියෙන්. පෝලියෝ රෝගය සඳහා එන්නත ලබා ගන්නේ වඳුරන්ගේ වකුගඩුවල ඇති පෝලියෝ වයිරසය ලබා ගැනීමෙන්. මේ හැම ඖෂධයක් නිෂ්පාදනය කරලා නිසිවිදියට යහපත් විදියට ප්‍රතිඵල දෙනවාදැයි දැන ගැනීමට මුලින්ම පර්යේෂණවලට යොදා ගන්නේ සතුන්වමයි. පුදුමයි නේද?

(පොත පත ඇසුරින්)

**ටෙක්ලා කල්දේරා**



## අපේ ආදි මව්පියෝ

**නතාරි වගීෂා ජයකොඩි**

02 ශ්‍රේණිය

ශු. කාර්මෙල් දහම් පාසල , බුළුපිටිය



## දිව බොදුන

**ඉමල්කා සංදීපනී ප්‍රනාන්දු**

08 ශ්‍රේණිය

කුඩා මඩු දහම් පාසල - උඩයන්දළුව

කන්ජුක්කුලිය මීසම

## යහපත් බැටළු එඬේරාණෝ

**රන්දික දේශාන් පීරිස්**

09 ශ්‍රේණිය

ශු. පාතිමා දහම් පාසල - මුදුකටුව



# පුංචි අපේ චිත්‍ර පිටුව

## දිය ඇල්ල

**නතාෂා රුෂානි පෙරේරා**

07 ශ්‍රේණිය

සා. මරියා දහම් පාසල - කෑගල්ල





## මෝස්තරයක්

**චේතනා කව්‍යාංජලී පෙරේරා**

06 ශ්‍රේණිය

සාන්ත සෙබස්තියන් දහම් පාසල

කටුනේරිය



## දේව දූතයෙක්

**චමෝදි මල්ෂානි කෲස්**

07 ශ්‍රේණිය

දංකොටුව බාලිකා මහා විදුහල

# අන්තියෝකියේ ඉග්නාසියස් මුනිතුමා

සුදුවර චරිත



ක්‍රි.ව. 50 - 115 අතර කාලය තුළ මෙතුමා ජීවත් වන්නට ඇතැයි සැලකේ. ශුද්ධවූ ඉරනේවුස් තුමා වාර්තා කරන ආකාරයට මෙතුමා අන්තියෝකයේ දෙවැනි රදගුරුතුමාය.

එව්සේබියස් තුමාට අනුව ක්‍රි. ව. 69 දී පමණ ආරම්භ වූ ඉග්නේසියස් තුමාගේ රදගුරු පදවිය දෙවෙනි සියවස දක්වා දිව යයි. ක්‍රි.ව. 98-117 අතර එනම් ට්‍රාජන් (Trajan) අධිරාජයාගේ පීඩන සමයේදී මෙතුමා මිය යන්නට ඇතැයි සැලකේ. ඔහු තුළ ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි පැවැති භක්තිය හා ප්‍රේමය නිසාම තම ජීවිතය පූජා කරනු දැකිය හැකිය. මේනිසාම මෙතුමාව තෙයෝෆොරස් (Theophorus) යන නාමයෙන්ද හඳුන්වනු ලැබේ. එහි අර්ථය නම් දෙවියන් වහන්සේව රැගෙන යන්නා හෝ දෙවියන් වහන්සේ විසින් රැගෙන ගිය තැනැත්තා යනුයි.

තමා ඇදහූ කිතු දහමට අනුව නොබියව සාක්ෂි දැරූ එතුමාව අන්තියෝකියේ සිට රෝමයට සිර කරුවකු මෙන් රැගෙන ගිය බව සඳහන් වේ. ස්මිර්නාහි රදගුරු තුමා වූ පොලිකාප් තුමා ඇතුළු ක්‍රිස්තියානි ජනතාව මෙතුමාව හරසරින් පිළිගෙන ඇත. මේ යන අතරමගදී මෙම නවක ක්‍රිස්තියානි සභාවන්ට ලිපි 6 ක්ද ස්මිර්නාහි පොලිකාප් තුමාට එක් ලිපියක්ද ලියූ බව සඳහන් වේ. මෙතුමා මෙම ලිපි ලියන ලද්දේ අන්තියෝකියේ සිට රෝමය දක්වා හේවායන් 10 දෙනෙකුගේ ආරක්ෂාව යටතේ මරණ දඬුවම ලැබීමට යන අතරමඟදිය. මෙතුමා ලිපි 7 ක් ලියා ඇත. මේ ගමනේදී ස්මිර්නාහි සුළු කාලයක් නැවතුණු එතුමා එහි සිට රෝමයටද, එපීසියටද, මැග්නේසියාවටද, ටැරලීසියටද (Tralles) ලිපි 4 ක් ලියා ඇත. මෙම ලිපි ලිවීමේ මූලික පරමාර්ථය වූයේ එම ස්ථානයන්හි කිතුනුවන් දිරිගැන්වීමටය. මීට අමතරව රෝමයට ලියූ ලිපියේ තමන්ට මරණ දණ්ඩනය අහිමි නොකරන ලෙස ඉල්ලා ඇත. එසේම ෆිලඩෙල්ෆියාවටද, ස්මිර්නාවටද, පොලිකාප් තුමාටද ඉතිරි ලිපි 03 ක් ලියා ඇත

මෙම ලිපිවල සඳහන් දේවධාර්මික ඉගැන්වීම් - එපීසියට, මැග්නේසියාවට හා ටැරලීසියට ලියූ ලිපි මෙම ලිපිවල මූලික වශයෙන් සභා නායකයන්ගේ වැදගත් කමත් ඔවුන්ට අවනතව සිටිය යුතු බවත් පවසන අතර එද පැවති වේද භේද වාදීන්ට විරුද්ධව කටයුතු කළ යුතු බවත් සඳහන් වේ. -ෆිලඩෙල්ෆියාවට යවන ලද ලිපිය මෙහිදී මූලික වශයෙන් එවකට පැවැති වේද භේද නිසා ඇති විය හැකි ප්‍රශ්න ගැන අවබෝධ යෙන් සිටිය යුතු බව සඳහන් කරයි. මෙම වේද භේද නිසා සභාවේ සාමූහිකත්වය හා සාමය නැති විය හැකි බව අවධාරණය කරයි.- ස්මිර්නාවට ලියූ ලිපිය මෙහිදී විශේෂයෙන් ඩොසෙටික් (Docetic) වාදීන් නිසා ඇතිවිය හැකි ප්‍රශ්න ගැනත් ඒ ගැන අවබෝධයෙන් සිටිය යුතු බවත් සඳහන් වේ. මීට අමතරව ක්‍රිස්තියානි ජනතාව හා සභා නායකයන් අතර පැවැතිය යුතු සම්බන්ධතාවය ගැන පැහැදිලි කරයි.- පොලිකාප් තුමාට ලියූ ලිපිය මෙහිදී සභා නායකයන්ගේ වගකීම ගැන හා යුතුකම් ගැන පැහැදිලි කරයි.- රෝමයට ලියූ ලිපිය ක්‍රිස්තියානි ජනතාවගේ අධ්‍යාත්මික ජීවිතය ගැනත් ඔවුන් කෙසේ ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරිය යුතුද යන්න ගැනත් සඳහන් වේ. මීට අමතරව ඔහුගේ ප්‍රාණ පරිත්‍යාගී ජීවිතය ගැනද සඳහන් කරයි. මෙම ලිපිවලින් පැහැදිලිව මෙතුමා කියා සිටියේ ක්‍රිස්තුස්වහන්සේව අදහාගෙන ජුදෙව්වන් ලෙස ජීවත් නොවිය යුතු බවයි. ජුදෙව් මත අතහැර දමා අවංකව ක්‍රිස්තු භක්තිකයෙක් වන ලෙස ඔවුන්ට ආරාධනා කර ඇත. මෙම ලිපිය තුළ සභා නායකයන් හෙවත් රදගුරුවරුන්ගේ මූලික කාර්යභාරය ගැන සඳහන් වේ. රදගුරුතුමා සංඝයේ නායකයා බැවින් සංඝය එකමුතු කිරීම එතුමාගේ වගකීමවේ. රදගුරුතුමා සංඝයේ ගුරුවරයා බව කියන ඉග්නේසියස් තුමා සාමාජිකයන් ශුද්ධවත් කිරීම එතුමන්ලාගේ යුතුකම බව පැහැදිලි කරයි. එපමණක් නොව සභාවේ ව්‍යුහය ගැනද ශුද්ධවූ ත්‍රිත්වය ගැනද මාංශ ගතවීම ගැන හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගැනද මෙම ලිපි වලින් උගන්වයි. සභා ඉතිහාසයේ මේ කාල වකවානුව ඩොසෙටික් වාදය බහුල ලෙස පැතිර ගිය සමයයි.

ක්‍රිස්තුස් වහන්සේ මිනිස් සිරුරක් නැතහොත් මනුෂ්‍යත්වයක් ඇතිව සිටි බව පිළිගැනීමට ඩොසෙටික් වාදීහු මැලිවූහ. ක්‍රිස්තුන් වහන්සේ මරණයට පත් වූයේ බාහිර පෙනුමෙන් පමණක් බව ඔවුන්ගේ මතය විය. ඔවුන්ගේ මතය අනුව ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ නම් දුක්විඳ මරණයට පත්විය නොහැකි බව ඔවුන්ගේ මතයයි. ක්‍රිස්තියානි දේවධර්මාචාර්යවරුන් අතර ක්‍රිස්තුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය ගැන ඩොසෙටික් වාදීන්ට විරුද්ධව පැහැදිලිව කරුණු ඉදිරිපත් කළේ ඉග්නේසියස් තුමාය. මෙතුමා එපීසවරුන්ට ලියූ ලිපියේ ක්‍රිස්තුස් වහන්සේගේ උපත, මරණය හා උත්ථානය යන ඓතිහාසික සිදුවීම් සනාථ කරමින් කරුණු ඉදිරිපත් කර ඇත

**අසේල දසනායක විසිනි**

## ප්‍රහේලිකා අංක 41

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | ■ |
| | ■ | | ■ | 4 | 5 |
| | ■ | 6 | 7 | | |
| 8 | 9 | ■ | | ■ | |
| ■ | | ■ | ■ | 10 | ■ |
| ■ | 11 | | | | ■ |

### හරහට

1. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වීමට ......... හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදළ සේක, මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. ශුද්ධවූ සභාවේ පනත් සංඛ්‍යාව

6. දෙවිපියාණන් අපට දී ඇති හැකියාවන් වර්ධනය කර දේව රාජ්‍යය වෙනුවෙන් යෙදවිය යුතු බව පෙන්වීමට ..... දසය පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. තම ....සතුටු කරන තැනැත්තේ සමිඳුන්ට කීකරු වන්නේය. යනුවෙන් උපදෙශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

11. අග්‍රදූතයන්ගෙන් එක් කෙනෙකි.

### පහළට

1. සදොම් සහ ගොමෝරා නුවරවල් .... වලක්වාලීමට ආබ්‍රහම් තුමා දෙවිපියාණන් ඉදිරියේ මැදිහත් විය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

2. ක්‍රිස්තුන් වහන්සේ සිදුකළ විවිධ ප්‍රාතිහාර්යයන් නිසා උන්වහන්සේ පිළිබඳ පුවත...... පැතිරී ගියේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ගිනිගත් නොදැවෙන පඳුර මැදින් දෙවිඳුන් මෝසෙස්ට කථා කරමින් ''ඔබේ පාද වලින් ..... ගලවා දමන්න''. ඔබ සිටින ස්ථානය ශුද්ධ භූමියෙකැ'යි වදළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

5. ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ග රාජ්‍යයේ ..... ශු. පේදුරු තුමාට පැවරූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. බදු පොළේ සිටි මෙම අයකැමියාට ක්‍රිස්තුන් වහන්සේ ''මා අනුව එන්න ''යයි වදළ සේක.

9. කානා නුවර විවාහ මංගල්‍ය අවස්ථාවේදී ක්‍රිස්තුන් වහන්සේ මේවා මිදි යුෂ බවට හැරවූ සේක.

10 මේවා ගසා මරා දැමීම සඳහා පව්කාර ස්ත්‍රීය මිනිසුන් විසින් ක්‍රිස්තුන් වහන්සේ වෙතට ගෙන ආවේය.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 5/27,18, 9/11 ශු. මාක් 1/40 , ශු. ජුවාම් 8, උපදේශකයා හෙවත් සිරාක් 3/6, උත්පත්ති18/16, නික්මයාම 3/5

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** – කිරිමැටියාගාර

## ප්‍රහේලිකා අංක 40 පිළිතුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 ගො | ල් | 2 ගො | 3 තා | ■ | ■ |
| ය | ■ | 4 වී | ර් | ය | ■ |
| 5 ම | 6 හ | න් | සි | ■ | 7 අ |
| ■ | ග් | ■ | 8 යු | ද් | ධ |
| 9 ස | ග | ■ | ස් | ■ | ම |
| ■ | යි | ■ | ■ | ■ | ■ |

## ප්‍රහේලිකා අංක 40 - ජයග්‍රාහකයෝ

- **1 වන ස්ථානය**

  තිළිණ දිල්ශාන් - 07 ශ්‍රේණිය

  ශා. ජෝසප් දහම් පාසල - මැදවච්චිය

- **2 වන ස්ථානය**

  සඳුනි කාර්මෙල් - 11 ශ්‍රේණිය

  ශු. ඌගෝ මුනි දහම් පාසල - වීරකොඩියාන

  (තල්ගහපිටිය මීසම)

- **3 වන ස්ථානය**

  සෙනුරි තරුෂිකා - 05 ශ්‍රේණිය

  උත්ථාන වූ කිතු සමිඳුන්ගේ දහම් පාසල - මහියංගනය

**"ළමා ප්‍රදීපය" 5 වන සංවත්සරයට ඔබත් එක්වන්න.**

ආදර දුවේ පුතේ, ''ළමා ප්‍රදීපය'' ළමා ඔබේ
පුවත් පතේ 5 වන සංවත්සර කලාපය සඳහා
ඔබේ සුභ පැතුම්, නිර්මාණ ඔක්තෝබර් 25 වන දිනට පෙර,
''ළමා ප්‍රදීපය'', 5 වන සංවත්සර කලාපය අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.

සංස්කාරක පියතුමා


..මෝසෙස් මිදියන්.. දේශයට පැමිණෙයි..
මිදියන් වලටත් ආව..
ආනන්ද කල්දේරා රචනා කරන..
20
ශුද්ධවූ බයිබලය ඇසුරෙන්..
මෝසෙස්
මිදියන් හි ජේත්‍රෝ නැමැති වැදගත් මනුෂ්‍යයෙක් සිටියා.. ඔහුගේ දූවරුන් බැටළුවන්ට බීමට වතුර දීමට අසල ඇති ළිඳ වෙතට පැමිණියා...
දෙබස් හා චිත්‍ර: ඇස්. ඒ. පී. සදුආරච්චි
ඒ තැනට පසුව පැමිණි එඬේරුන් පිරිසක් ඔවුනට තර්ජනය කරනු.. මෝසෙස් දුටුවේය..
ඕ! අර මොකද ඒ මිනිස්සු.. අර තරුණියන් හට බැන වදින්නේ...
ඒයි කෙල්ලනේ අපේ බැටළුවන්ට බොන්ට... වතුර ගන්නට පස්සෙ උඹලගේ උන්ට වතුර දීපල්ලා..
ඒයි ඔහොම හිටපල්ලා.. ඉස්සෙල්ලම ආවෙ මේ තරුණියො නේද.. පලයල්ලා යන්න..
ඩිෂ්!
ආව්
මෝසෙස් ඔවුනට පහර දෙයි..
මේ තරුණියන්ගේ බැටළුවන්ට බීමට වතුර ගන්නට පසුව නුඹලාගේ බැටළුවන්ට වතුර ගත හැකියි..
පසුව ගෙදර ගිය එම තරුණියන් සිය පියාට එම විස්තරය කීමෙන් පසු..
ඇයි ඔහුව එන්න කිව්වෙ නැත්තේ.. ඉක්මනට ඔහුව එක්ක එන්න...
ඕ: මේ අර තරුණියන්ගෙන් කෙනෙක් නේද.. මොකද ආයි මෙහෙට..... දුවගෙන එන්නෙ..

# ළමා ප්‍රදීපය



# පුංචි අපිත් දේව වචනයට විවර වෙමු !

බයිබලය, ශුද්ධවූ ලියවිලි පාඨ, ගීතිකා පොත්, සාන්තුවර චරිත කතා, වැනි බොහෝ ප්‍රකාශන තුළින් දෙවිඳුන් අපිට අනාවරණය වෙනවා, අපිට ඒ තුළින් කතා කරනවා, පණිවුඩ ලබා දෙනවා, දේව සැලැස්ම අපට අනාවරණය කරනවා.....

එනිසාම නිතරම අපිත් දේව වචනය කියවීම, දේව වචනයට සවන් දීම, දේව වචනය ගැන ඉගෙන ගනිමින් ඒ ගැන කතා බහ කිරීම අත්‍යාවශ්‍යම කරුණක්.....

ඡායාරූප : අශේන් එස්. සේනාරත්න




